දිවිනැගුම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිවිනැගුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**දොරින් දොරට - ගමින් ගමට**

## <u>දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන - 2014</u>

පුද්ගලයා, පවුල සහ කණ්ඩායම් කේන්ද්‍රගතවූ ජීවනෝපාය සංවර්ධනය හරහා ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන සැලසුම් කර ඇත.

මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ, පවුල් ඒකකය තුල වියදම අඩුකර ගැනීමත්, අමතර ආදායම් ලබාගැනීමේ සහ ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් ගෘහස්ථ මට්ටමින් කෘෂිකාර්මික, කාර්මික හෝ සේවා ක්ෂේත්‍රයන් තුලින් රැකියා අවස්ථා ඇතිකරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෙන් කරන ලද ප්‍රතිපාදන මේ වන විටත් කලාප කාර්යාල වෙත ලබාදී ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත ' 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අත්වැල ' හි සඳහන් උපදෙස් වලට අනුකූලව දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට වැඩිදුරටත් මඟ පෙන්වීමක් ලෙස මෙම උපදෙස් නිකුත් කරනු ලබන අතර ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මේ සංධිස්ථානයක් බවට පත් කර ගැනීමට ඔබ ඇතුළු අදාළ නිලධාරීන්ගේ ක්‍රියාකාරී දායකත්වය ඉතා වැදගත් වේ.

මේ අනුව පහත පරිදි ප්‍රධාන අංශ 04 ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

1. කෘෂි සංවර්ධන වැඩ සටහන
2. පශු සම්පත් සංවර්ධන වැඩ සටහන
3. ධීවර සංවර්ධන වැඩ සටහන
4. කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන

පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඔබ කලාපයේ හා දිස්ත්‍රික්කයේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මැනවි.

## 01. කෘෂි සංවර්ධන වැඩ සටහන

- තම ගෙවත්ත තුල එළවළු, පළතුරු, පලා වර්ග සහ රම්පේ, කරපිංචා, ඉඟුරු, දෙහි, කහ වැනි එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය භෝග වගා කර පවුලේ අවශ්‍යතා සපුරා ගැනීම තුලින් පවුලේ ජීවන වියදම අඩුකරලීම.

- ගෙවත්ත තුල හැකි තරම් කෘෂිකාර්මික භෝග වගාකිරීම තුලින් තම පරිභෝජනයට වඩා ඇති වන

  ඉතිරිය වෙළඳ පොළට අළෙවි කිරීමට ඉඩ අවස්ථාව සලසා දීම හරහා පවුල් ඒකකයට අමතර ආදායම් ලබාගැනීමේ අවස්ථා උදාකරදීම. විශේෂයෙන් නිවසේ රැඳී සිටින ගෘහණියන්ගේ අපතේ යන කාලය මෙම ක්‍රියාවලියට උපයෝගී කරගැනීමට අවස්ථාව සලසා දීම.

- තම ඉඩමේ සාමාන්‍යයෙන් අක්කර 1/4 කට වඩා වැඩිපුර තිබෙන ඉඩම් ප්‍රමාණය ඒ ප්‍රදේශයට ආවේණික බෝග වගාවන් සඳහා උපරිම වශයෙන් යොමු කිරීම. උදා- කෙසෙල්, අන්නාසි, පැපොල්, මුරුංගා, පේර, දොඩම්, කිරිඅල, ඉඟුරු, කහ, ගම්මිරිස්, මිරිස්, උඳු, තේ, රබර් ආදී වශයෙන් .

- ආරක්ෂිත දැල් ගෘහ තුල වගාවන් කිරීම. මෙයින් බලාපොරොත්තු වන්නේ අවාරයට එළදාව ලබාගැනීමත්, කෘමි උවදුරු, වර්ෂාව, හිරුඑළිය වැනි ස්වාභාවික උවදුරු වලින් වළක්වා ගැනීමත්ය.

- හඳුනාගත් කුඩා තේ/රබර්/පොල් වතුවල නව වගාවන් ඇති කිරීම,පාළු සිටුවීම හා අතුරු භෝග වගාවන් මෙන්ම යටි වගාවන් ප්‍රචලිත කිරීම.

- එක් කන්නයක් පමණක් වගාකරන හා පුරන්වූ කුඹුරුවල කෙටිකාලීන භෝග වගාකිරීමට උනන්දු කරලීම. (රටකජු, සෝයා බෝංචි, උඳු හා තල ඇතුළු ධාන්‍ය වර්ග)

- අගය එකතු කල හැකි දේශීය ආහාර බෝග වගාවන් කෙරෙහි යොමු වීම හා නිෂ්පාදන වර්ධනය කරලීම. උදා ගොරකා, දෙහි, අඹ, අන්නාසි, මඤ්ඤොක්කා, බතල, රටකජු

- දේශීය හා පාරම්පරික ආහාර බෝග වගාවන් ප්‍රචලිත කිරීම තුලින් ප්‍රතිලාභීන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම. (සුවදැල්, මාවී, හීනටි ආදී)

- නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජාතියක් උදෙසා කාබනික පොහොර භාවිතයට ජනතාව උනන්දු කරලීම.

- ප්‍රාදේශීයව හඳුනාගෙන ඇති ප්‍රධාන බෝග සඳහා ගම්මාන වශයෙන් කණ්ඩායම් ඒකරාශී කර වානිජ ස්වරූපයකින් වගාවන් කිරීමට ජනතාව උනන්දු කරලීම.

- ආයුර්වේද ඖෂධ වශයෙන් යොදා ගත හැකි බෝග වර්ග ව්‍යාපාරයක් වශයෙන් වගා කල හැකි ගෘහ ඒකක හඳුනාගෙන ඒ සඳහා යොමු කරලීම උදා - පොල්පලා, ඉරමුසු, රණවරා, හාතවාරිය,වැල්පෙනෙල, නීරමුල්ලිය ආදිය.

- ස්වභාවික විසිතුරු මල් හා පත්‍රිකා වගාවට ප්‍රතිලාභීන් උනන්දු කරලීම මගින් ස්වයං රැකියා අවස්ථා උත්පාදනය කරලීම.

- ගම්මිරිස්, කුරුඳු , වැනිලා, පුවක් වැනි අපනයන කෘෂිකර්ම බෝග වගා කිරීමේ වැදගත්කම හා එයින් ලබා ගත හැකි ආදායම පිළිබඳව ප්‍රතිලාභීන් දැනුවත් කිරීම හා දැනට වගාවේ නිරතවූවන්ගේ නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කරලීම.

- අමතර ආදායම් මාර්ගයක් ලෙස මීමැසි පාලනය ප්‍රචලිත කිරීම.

- ආනයන ආදේශන වශයෙන් වගා කළ හැකි බෝග සඳහා ඉඩම් යොමුකරලීම. උදා- මිරිස්, අර්තාපල්, ඖෂධ වර්ග
- ප්‍රධාන ව්‍යවසායකයින්ට අවශ්‍ය තොග සැපයීම සඳහා ගම් මට්ටමින් හඳුනාගත් ගෙවතු වල හෝ ආරක්ෂිත ගෘහ තුල බෝග වගා කිරීමට ප්‍රතිලාභීන් උනන්දු කරලීම හා අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම.
- කලාපයේ හා දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන කෘෂි කර්මාන්තයන් හඳුනා ගැනිම හා ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය හා සේවාවන් සැපයිම සඳහා ස්වයං රැකියා අවස්ථා ඇති කරලීම.

## 02. පශු සම්පත් සංවර්ධන වැඩ සටහන

- දෛනික පරිභෝජනයට අවශ්‍ය කිරි,බිත්තර ගෘහස්ථ මට්ටමින් නිෂ්පාදනය කර ගැනීම හා අමතර ආදායමක් ලබා ගැනීමට ගෘහ ඒකක යොමු කිරීම.
- දියර කිරි භාවිතයට ප්‍රතිලාභීන් යොමු කරලීම , ප්‍රචලිත කරවීම හා කිරි ගොවීන් නඟා සිටුවීම.
- ගෘහ ඒකක මට්ටමින් ගම් කිකිළියන් ඇති කිරිම හා ගම් බිත්තර නිෂ්පාදනය වැඩිකිරීමට කටයුතු කිරීම හා පවුලේ පෝෂණ අවශ්‍යතාවයන් සපුරාලීමට කටයුතු කිරීම.
- ගෘහ ආශ්‍රිතව ගවයින්, එළුවන් හා ඌරන් ඇති කිරිම ව්‍යාප්ත කිරිම මඟින්, අතිරේක අදායම් මාර්ග වැඩි කිරීම.
- ප්‍රමිතියෙන් යුතු සත්ත්ව ගාල් ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම.
- සත්ත්ව ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම තුලින් පවුලේ ආදායම වැඩිකර ගැනීම. උදා- තෘණ හා ශාක වගාව.
- ප්‍රාදේශීයව පිහිටා ඇති සත්ත්ව නිෂ්පාදන ආයතන සඳහා ඊට අවශ්‍ය සැපයුම් ලබා දිමට අදාලව ස්වයං රැකියා අවස්ථා ඇති කිරිම.
- ක්‍රමවත් ආකාරයෙන් සත්ත්ව පාලන ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීම හා සම්බන්ධීකරණය.
- යෝගට්, මී කිරි, බටර්, චීස්, එළගිතෙල් වැනි කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීයව හඳුනාගත් ගෘහ ඒකක යොමු කිරීම.

## 03. ධීවර සංවර්ධන වැඩ සටහන

- පවුලේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරා ගැනීමට මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිම
- මත්ස්‍ය අලෙවිය වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම.
- විසිතුරු මත්ස්‍ය හා ජලජ පැලැටි වර්ධනය කල හැකි ගෘහ ඒකක හඳුනාගෙන ඊට අවශ්‍ය සහායන් හා පහසුකම් ලබා දීම.
- වැව් හා ජලාශ ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව සඳහා ප්‍රතිලාභීන් යොමු කිරීම.

- කාලීන ජලාශ වල මත්ස්‍ය වගාව වර්ධනය.
- දූම්කරවල සැපයිය හැකි ප්‍රදේශ හඳුනාගෙන එම නිෂ්පාදනය වර්ධනය කිරීම.
- වැව් ආශ්‍රිතව දේශීය හා විදේශීයව සංචාරකයින් සඳහා මාළු ආශ්‍රිත නිෂ්පාදන වර්ධනය කිරීම.
- පොකුණු තුල මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම හා ඇසිත්තන්, ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම.
- කරවල, උම්බලකඩ, ජාඩි, මාළු අච්චාරු වැනි අගය එකතු කල ධීවර නිෂ්පාදන කිරීමට ගෘහ ඒකක උනන්දු කිරීම.
- වැඩි ආදායම් මාර්ග ලබා ගත හැකි ඉස්සෝ, දැල්ලෝ හා බෙල්ලන් වගාව කෙරෙහි ප්‍රතිලාභින් යොමු කරලීම.
- ධීවර සමිති වඩාත් ක්‍රියාකාරී බවට පත් කොට මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

**04.** කර්මාන්ත සංවර්ධන වැඩ සටහන

- වේවැල්, උණ ලී, පන් හා පොල් කටු ආශ්‍රිත ගෘහස්ථ කර්මාන්ත වර්ධනය කිරීම.
- ලාක්ෂා, පිත්තල, ජේෂකර්ම, බීරළු වැනි සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරිමට කටයුතු කිරීම.
- ගෘහස්ත කර්මාන්ත සඳහා හඳුනා ගෙන ඇති ප්‍රතිලාභින්ට අවශ්‍ය පුහුණුවීම් ලබා දිම.
- කෘෂි, සත්ව පාලන හා ධීවර කර්මාන්ත සඳහා අවශ්‍ය මෙවලම් (පිහි, කැති, උදළු, කුකුල් කූඩු, මීමැසි පෙට්ටි ආදි ) නිශ්පාදන සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන් ,ගම්මාන මට්ටමින් සංවර්ධනය කිරීම.
- ප්‍රදේශයේ පවතින ප්‍රධාන කර්මාන්ත වලට අවශ්‍ය අමතර කොටස් හා උපාංග නිෂ්පාදනයන් ගෘහ කර්මාන්ත වශයෙන් ප්‍රචලිත කිරිමට කටයුතු කිරිම.
- නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත හා සේවා ආශ්‍රිත කර්මාන්ත සහ ආනයන ආදේශන කර්මාන්ත ප්‍රචලිත කිරීම.
- කිතුල් /තල් වගාව දියුණු කිරිමත් ආශ්‍රිත නිශ්පාදන වර්ධනය කිරිමටත් කටයුතු කිරිම.
- සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම හරහා එම කර්මාන්ත වැසී යාමේ අවදානම අවම කිරීම.
- විදේශීය සංචාරකයින් සඳහා ශ්‍රී ලාංකීය නිෂ්පාදන (සිහිවටන,විසිතුරු භාණ්ඩ) ඉදිරිපත් කිරීමට ප්‍රතිලාභීන් උනන්දු කිරීම.
- වෘත්තීය පුහුණුව ලබාදීම හා ව්‍යාපෘතියට අවශ්‍ය මෙවලම් ලබාගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසා දීම.
- සාම්ප්‍රදායික/පාරම්පරික නිමැවුම් ගම්මාන සංවර්ධනය කිරීම හා පිහිටුවීම හරහා දේශීය හා විදේශිය සංචාරකයින්ගේ ආකර්ශනීය මධ්‍යස්ථාන බවට පත් කිරීම.

දිස්ත්‍රික්කය තුල මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට අවශ්‍ය තාක්ෂණික සහාය, පුහුණු හා සේවා අවශ්‍යතාවයන් අදාළ දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන , දෙපාර්තමේන්තු මණ්ඩල වෙතින් ලබා ගැනීමට කටයුතු කල යුතුවේ.

**05.** **ව්‍යාසායක ගම්මාන ඇති කිරීම.**

කිසියම් ගම්මානයක හෝ ප්‍රදේශයක එකම ස්වභාවයේ නිෂ්පාදන ක්‍රියාවලියක නිරතව ඇති පුද්ගලයින් එක් කණ්ඩායමක් ලෙස කණ්ඩායම්ගත කොට මෙම වැඩ සටහන යටතේ මූලා පහසුකම් ලබාදීම, ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුහුණු කටයුතු සහ වෙළඳපොල අවස්ථා උදාකර දීම වැනි කටයුතු මෙහෙයවීම අවශ්‍යවේ. මෙමගින් කුඩා ව්‍යවසාය ගම්මාන ප්‍රචලිත කිරීම අපේක්ෂා කෙරේ.

**06.** **ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම**

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම හා අධික්ෂණය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළාප, දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා වසම් මට්ටමේ දිවිනැගුම නිලධාරීන් හරහා සිදු කළ යුතුවේ.

**07.** **ප්‍රජා මූල සංවිධාන සහභාගිත්වය**

ගම් මට්ටමින් දැනට පිහිටුවා ඇති ප්‍රජා මූල සංවිධාන ( උදා- ග්‍රාම සංවර්ධන සමිති, ගොවි සංවිධාන, කාන්තා සමිති හා යෞවන සමාජ ආදි...) සහ අළුතින් පිහිටුවීමට බලාපොරොත්තුවන දිවි නැගුම ප්‍රජා මූල සංවිධානද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගත යුතුවේ. තවද සමජාතීය ක්ෂේත්‍රවල නිරත ප්‍රතිලාභින්, කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය කර ඵලදායි වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කල යුතු වේ. විශේෂයෙන් යෙදවුම් ලබා දීම, දැණුම හා පුහුණුව ලබා දීම සඳහා එය වඩාත් පහසුවෙන් උපයෝගි කරගත හැකිය.

08. **ප්‍රතිලාභීන් හඳුනා ගැනීම**

ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේදී ඔබ කලාපයේ / දිස්ත්‍රික්කයේ සියළුම අඩු ආදායම්ලාභීන් මූලික වශයෙන් ඉලක්ක කර ගැනීම ප්‍රධාන වන අතර දිවි නැගුම ජාතික සංවර්ධන වැඩ සටහනට ඒකාබද්ධ වීමට උනන්දුවක් දක්වන පවුල් කෙරෙහිද අවධානය යොමු කිරීම තුලින් රටේ ආර්ථික වර්ධනයට විය හැකි දායකත්වය ඉතා ඵලදායි බව සඳහන් කරමි.

- එසේම ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති පවුල්, වැන්දඹු පවුල්, ආබාධිත පවුල් හා රණවිරු පවුල් කෙරේ විශේෂ අවධානය යොමු කිරීම අනිවාර්ය වේ.

- ඔබේ කලාපය / දිස්ත්‍රික්කය තුල ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේදී කාන්තාවන් ස්වයං රැකියා ගත කිරිමේ ප්‍රතිශතය වැඩි කර ගැනීමටද කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙමි.

- ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, ප්‍රජා මූල සංවිධාන සහාය හා එකඟත්වය ලබාගෙන ප්‍රතිලාභියා හඳුනාගැනීමේ කටයුතු සිදු කළ යුතුවේ.

**09.** **ව්‍යාපෘති සැලසුම් කිරිම**

සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කල යුතු අතර එයට දිවිනැගුම වසම්භාර නිලධාරින්ගේ හා දිවිනැගුම ප්‍රාදේශිය නිලධාරින්ගේ නිර්දේශයන් අවශ්‍ය වේ.

මෙම ව්‍යාපෘති වාර්තාව සංක්ෂිප්ත විය යුතු අතර, එය ආකෘති පත්‍ර අංක 01 පරිදි සකස් කල යුතුවේ.

**10.** **ව්‍යාපෘති තෝරා ගැනිම හා අනුමත කිරිම**

දිවි නැගුම වැඩ සටහන පිළිබඳව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මූලික දැනුවත් කිරීමක් රාජ්‍ය නිලධාරීන් හා දේශපාලන නායකත්වය කැඳවා සිදු කරන ලද අතර සෑම මට්ටමක දිවිනැගුම නිලධාරීන්ද ප්‍රජා මූල සංවිධාන ද දැනුවත් කිරීම මේ වන විට ඔබ කලාපය/ දිස්ත්‍රික්කය තුල සිදු කර අවසන්ව ඇතැයි අදහස් කරමි.

- ව්‍යාපෘති තෝරා ගැනීමේදී, ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය වඩා වර්ධනය කරගත හැකි හා පවුලේ ආදායම වැඩිකරගත හැකි ව්‍යාපෘති යෝජනා කෙරේ ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර එම යෝජනා ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේ එකඟත්වයට අනුව ප්‍රාදේශිය ලේකම් විසින් අනුමත කල යුතුවේ.

- එසේ අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍ර 02 අනුව ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වේ. දිස්ත්‍රික්කය තුල අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය දිස්ත්‍රික් ලේකම් විසින් සිදුකල යුතුවේ.

- වෙන් කර දී ඇති ප්‍රතිපාදන ඇතුලත අනුමත කරන ලද සියළු ව්‍යාපෘති වල සෑම මසකම ප්‍රගති වාර්තාවක් එළඹෙන මස 05 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් මුදල් අග්‍රිම ලබා ගැනිම සඳහා දිවිනැගුම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම අවශ්‍ය වේ. ඒ අනුව මුදල් අග්‍රිම නිදහස් කරනු ඇත.

- කලාප භාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ ඒ දිස්ත්‍රික් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, අධීක්ෂණය හා මෙහෙයුම, පසු ඇගයීම, ප්‍රගති සමාලෝචනය, වාර්තා ඉදිරිපත් කිරිම, සහාය සේවා ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදුකල යුතුවේ. එලඹෙන මස 10 දිනට පෙර ආකෘති අංක 03 ට අනුව සෑම මසකම භෞතික හා මූල්‍ය ප්‍රගතිය ප්‍රධාන කාර්යාලය වෙත එවීම අවශ්‍ය වේ.

- දිවිනැගුම කලාපය තුල ක්‍රියාත්මක සියළු ව්‍යාපෘති විස්තර edivineguma gov.lk ඔස්සේ වැඩසටහන් කලමණාකරණ මොඩියුලය ( PPM ) මගින් ඇතුලත් කිරිමට කටයුතු කිරිමේ වගකිම ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ප්‍රාදේශීය දිවි නැගුම නිලධාරීන් සතුවේ.

  මෙය නිසි පරිදි සිදුවන බවට මෙහෙයුම් කිරිම, අධික්ෂණය කිරිම දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරින් හා කලාප දිවිනැගුම නිලධාරින් විසින් සිදුකළ යුතුවේ.

**11.** **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

- ජීවනෝපාය ව්‍යාපෘති වෙනුවෙන් සිදුකරනු ලබන සියළු මිලදී ගැනීම් සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිම අවශ්‍යා වන අතර මුදල් රෙගුලාසි අනුගමනය කරමින් අදාල ආයතන / දෙපාර්තමේන්තුවල නිර්දේශිත මිල ගණන් යටතේ ගෙවීම් සිදුවිය යුතුවේ.
- ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභවතාවයන්ට උචිත පරිදි වෙන් කර දී ඇති ප්‍රතිපාදන ගලපා ගැනිමට කටයුතු කළ යුතුවේ.
- ව්‍යාපෘතිය ආරම්භ කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යෑම, ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනිම හා වාරික ගෙවීම් නිසි පරිදි සිදුකරන බවට ප්‍රතිලාභියා සමඟ ගිවිසුම්ගත විය යුතුය. දිවිනැගුම ප්‍රාදේශීය නිලධාරී, ප්‍රතිලාභියා සමඟ ගිවිසුමකට එළඹීම වඩාත් සුදුසු වේ.
- ප්‍රතිපාදන නිදහස් කිරීම වියදම් දැරීමට ප්‍රමාණවත් බලයක් සේ නොසැලකිය යුතු අතර අපේක්ෂිත අරමුණු සඳහාම පමණක් ප්‍රතිපාදන යොදාගත යුතුවේ.
- කෙසේ වුවද 2014 වර්ෂය තුලදී අනුමත සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර කිසිඳු හේතුවක් මත ඉදිරි වර්ෂය සඳහා අඛණ්ඩ නොකළ යුතුවේ.

ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමේදි සිදුවිය හැකි අක්‍රමිකතා වැලැක්විම හා විනිවිදභාවය සුරැකිම රාජ්‍ය නිලධාරින් සතුවේ.

**12.** **මුදල් මූලාශ්‍රයන්**

මෙම වැඩසටහන යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන වලට අමතරව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ එකඟත්වය මත

- ගම නැගුම - එක් ගමකට එක් වැඩක්
- ගම නැගුම විශේෂ ව්‍යාපෘති
- පළාත් /පුර නැගුම
- විමධ්‍යගත ප්‍රතිපාදන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා යොදාගත හැකිය.

එමෙන්ම පහත සඳහන් මූලාශ්‍ර යටතේද ණය පහසුකම් ලබාගැනීමට අවශ්‍යා සහාය හා සම්බන්ධීකරණය දිවිනැගුම වසම් භාර නිලධාරීන් විසින් ප්‍රතිලාභින් වෙත ලබාදිය යුතුවේ.

- දිවිනැගුම ප්‍රජා මූල බැංකු
- චක්‍රීය අරමුදල් මගින්
- සණස බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකු

**චක්‍රිය අරමුදල**

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා ලබා දෙන ණය මුදල් ආපසු අය කිරීම තුලින් බිහිවන චක්‍රිය අරමුදල නැවත නැවත ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා ණය ලබා දිමට යොමු කල යුතුය. ඒ සඳහා 5% ක උපරිම වාර්ෂික පොලී ප්‍රතිශතයක් අයකල හැකිය.

## 13. ප්‍රතිපාදන නිදහස් කිරිම

පහත සඳහන් නිර්ණායක වලට අනුකූලව ලබා දි ඇති ප්‍රතිපාදන නිදහස් කිරිමට කටයුතු කල යුතුවේ.

| අනු අංකය | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දිය හැකි අවස්ථා | මූලික නිර්ණායක |
|---|---|---|
| 01. | ව්‍යාපෘති මුදලම එනම් 100 % ක ප්‍රදානයක් ලබා දිම | • ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති පවුල් |
| 02. | | • කාන්තා මූලික පවුල්, වැන්දඹු පවුල් හා අබාධිත පවුල් |
| 03. | ව්‍යාපෘති මුදලම එනම් 100 % ක ප්‍රතිපාදන ලබාදී නැවත එම මුදලින් 50 % ක් චක්‍රිය අරමුදලට අයකර ගැනීම. | • අඩු ආදායම්ලාභින් සඳහා (වසමේ දිවිනැගුම සංවර්ධන නිලධාරි විසින් අඩු ආදායම් ලාභියෙකු බවට සහතික කල යුතුය.) |
| 04. | සමාන වාරිකවලින් මුළු මුදලම නැවත අයකර චක්‍රිය අරමුදලට දායක කළ හැකි පරිදි ව්‍යාපෘති මුදලින් 50 % ක ප්‍රතිපාදන ලබා දීම. ***ඉතිරි 50 % ක මුදල අදාල ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය.*** | • ගෙවීමේ හැකියාව ඇති යම් ආදායම් මට්ටමකට පැමිණි ප්‍රතිලාභීන් සඳහා<br>• දිවිනැගුම වැඩසටහන සඳහා ඒකාබද්ධ වීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් සඳහා |
| 05. | දිවිනැගුම ප්‍රජා මූල බැංකු / වෙනත් බැංකු ණය පහසුකම් ලබා දිම. | • වඩා වැඩි ආර්ථික වර්ධනයක් අපේක්ෂිත ප්‍රතිලාභින් සඳහා |
| 06. | ජීවනෝපාය චක්‍රිය අරමුදලින් ණය පහසුකම් ලබාදීම | • දිවිනැගුම වැඩසටහන සඳහා ඒකාබද්ධ වීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් සඳහා |

## 14. ප්‍රතිපාදන මුදල් පිළිබඳ සීමා

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රතිපාදන හෝ ණය පිළිබඳව නිශ්චිත සීමාවන් පනවනු නොලැබේ. ඒ ඒ ව්‍යාපෘතියේ ස්වභාවය, ප්‍රතිලාභියාගේ මූල්‍ය ශක්තිය වැනි කරුණු සැලකිල්ලට ගෙන ලබා දිය යුතු ණය පිළිබඳව තීරණය කල යුතුවේ.

**ව්‍යාපෘති සඳහා මුදල් අනුමත කිරිමේදි,**

- තනි පුද්ගලයෙකුට ලබා දිය හැකි ප්‍රදානයක උපරිම සීමාව රු. 50,000/- ක් විය යුතුවේ.
- චක්‍රිය අරමුදලට දායකවන ක්‍රමයට ණය ලබා දිමේ උපරිම සිමාව රු. 75,000/- ක් විය යුතුවේ.
- සාමුහිකව ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ණය ලබා දිමේ උපරිම සීමාව රු. 500,000/- ක් විය යුතුය.
- බැංකු ණය ලබා දිම සඳහා සම්බන්ධිකරණය සිදුකල යුතු අතර එම ණය මුදල් පිළිබඳව සීමා ඒ ඒ බැංකු විසින් සිය අභිමතය පරිදි ලබා දෙනු ඇත.

**ප්‍රදානයන් ලබා දීමේදි,**

ජීවනෝපාය විවිධ ව්‍යාපෘතිවල ඉදිකිරිම් සඳහා ප්‍රදානයන් ලබා දීමේදි ඒවායේ ඉදිකිරිම් අදාළ ප්‍රතිලාභියා විසින් සිදුකල පසු ඉදිකිරිම් වටිනාකම් පිළිබඳව කාර්මික නිලධාරි නිර්දේශය ලබා ගෙන ගෙවීම් කල යුතුවේ. තවද, ව්‍යාපෘතියේ ඉදිකිරිම් ආරම්භයේදි 20% ක උපරිමයකට යටත්ව අත්තිකාරම් මුදලක් ද ලබා දීමට හැකිවේ. උදා - හරිතාගාර, කුකුළු කුඩු, ගවගාල් වැනි.

මුදල් නිශ්කාර්ය විම වැළැක්විම සඳහා නිකුත් කරනු ලබන මුදල් ප්‍රතිපාදන සම්බන්ධයෙන් මනා විමසිලිමත් භාවයකින් හා වගකීමකින් යුතුව සියළු නිලධාරීන් කටයුතු කරනු ලැබිය යුතුවේ.

**15.** ව්‍යාපෘති කාල රාමුව

නිලධාරීන් දැනුවත් කිරීම මේ වන විට ඔබ කලාපය / දිස්ත්‍රික්කය තුල සිදුකර අවසන් ඇති බැවින් පහත කාල රාමුවට අනුව 2014 වර්ෂයේ ඉදිරි කාර්යයන් ක්‍රියාත්මක විය යුතුවේ.

| අනු අංකය | අයිතමයන් | කාල වකවානුව |
|---|---|---|
| 01 | ව්‍යාපෘති හඳුනා ගැනීම | ජුනි 30 ට පෙර |
| 02 | ප්‍රදේශීය සංවර්ධන කමිටු අනුමැතිය ලබා ගැනීම | ජුලි 31 ට පෙර |
| 03 | ව්‍යාපෘති ආරම්භ කිරීම | අගෝස්තු 31 ට පෙර |
| 04 | ව්‍යාපෘති නිම කිරීම | නොවැම්බර් 30 |
| 05 | පසු විපරම් කිරීම සහ ප්‍රගති සමාලෝචනය | ජුනි 05 - දෙසැම්බර් 31 |

## 16. ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම

මෙම කාර්යය භාරය ඔබ වෙත පැවරෙන අතර ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම් කිරිමේ ඍජු ක්‍රමවේදයක් ඒ ඒ කලාපය/දිස්ත්‍රික්කය විසින් සකස් කර ගැනිමට කටයුතු කලයුතු වේ.

මේ සඳහා ප්‍රාදේශිය සංවර්ධන කමිටුව විසින් ගන්නා තීරණයන්ට අනුව ව්‍යාපෘති අධික්ෂණය , පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය කල හැකි ක්‍රමවේදයක් ප්‍රාදේශිය මට්ටමින් ද සකස් කිරිම වැදගත් වේ.

මෙහිදි ප්‍රජා මුල සංවිධානද ව්‍යාපෘති අධික්ෂණය සඳහා සහභාගි කරවා ගත යුතු අතර සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් සකස් කරවා ගත යුතු වේ.

## 17. මෙහෙයුම් වියදම්.

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් 0.5 % ක මෙහෙයුම් වියදමක් දැරීමට හැකියාව ඇත. මෙයින් 0.2% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ද, ඉතිරි 0.3% ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහාද බෙදී යන පරිදි මෙහෙයුම් කටයුතු සඳහා වැය දැරීමට හැකි වේ.

## 18. කාර්යය සාධනය

සෑම නිලධාරියෙක් සඳහාම නිශ්චිත හඳුනා ගත් පවුල් ඒකක ගණනකගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරිම වෙනුවෙන් වු රාජකාරි වගකිම නිශ්චිතවම පැවරිමට කටයුතු කල යුතු අතර, එය ඉදිරි නිලධාරි කාර්යය සාධනයේදි වඩා ඵලදායි වනු ඇති බව අවධාරණය කරමි.

## 19. වැඩිදුර විමසීම්

දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පිළිබඳව ඔබට වැඩිදුරටත් විස්තර ලබා ගැනිම සඳහා දිවිනැගුම ඒ ඒ කලාප කාර්යාලයන්ගේ අදාළ නිලධාරින්ගේ දුරකතන අංකයන් ඇතුලත් කර ඇත.

***දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සාර්ථක කර ගැනිමට ඔබ ඇතුළු නිලධාරින් ගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරමි.***



ආර්. ඒ.ඒ.කේ. රණවක

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කාරු.දැ.ගැ. ස.
2. සියළුම ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා - කාරු.දැ.ගැ.ස.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු සම සභාපතිතුමන්ලා - කාරු.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමන්ලා - කාරු.දැ.ගැ.ස.
5. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
6. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
7. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
8. සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු, - කාරු.දැ.ගැ.ස.
9. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කාරු. අ.ක.ස.
10. සියළුම කලාප, දිස්ත්‍රික්, ප්‍රාදේශිය සහ වසම්භාර දිවිනැගුම නිලධාරින් - අ.ක.ස.
11. ප්‍රධාන ගණකාධිකාරි , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස..
12. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
13. විගණකාධිපති - දැ.ගැ.ස.
14. සියළුම අධ්‍යක්ෂවරුන්, දිවිනැගුම දෙපාර්තමේන්තුව - අ.ක.ස.

**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

# දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන - 2014

## ව්‍යාපෘති සාධ්‍යතා වාර්තාව

1. දිවිනැගුම කලාපය :- ……………………………………………………..…………
2. දිස්ත්‍රික්කය :- ………………………………………………..…………………
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ……………………………………….…………
4. ග්‍රාම නිලධාරී වසම :- …………………………………………………..………
5. ව්‍යාපෘතිලාභියාගේ නම :- ………………………………………………………………………………..……
6. ලිපිනය:- ……………………………..……………………………………………………….……… …… ……………………………………………………..…………………………………………… ……………
7. ජාතික හැඳුනුම්පත් අංකය :- ……………………………………………………..………
8. ව්‍යාපෘතියේ ස්වභාවය :- ……………………………………………………..………
9. ව්‍යාපෘතියේ අරමුණ :- ………………………………………..……………………………………………..……… ………..………………………………………………………………………………………………… ……………
10. ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය :-
11. ව්‍යාපෘතිය සඳහා දැනටමත් ආයොජනය කර ඇති මුදල් (ඇත්නම්)

| ප්‍රතිලාභියා විසින් ( රු.) | රජයේ මුදල් ( රු.) | බැංකු ණය / වක්‍රීය අරමුදල් ( රු.) | වෙනත් ( රු.) (සඳහන් කරන්න) | එකතුව ( රු.) |
|---|---|---|---|---|
| | | | | |

12. ව්‍යාපෘතියට අවශ්‍ය යෙදවුම් හා පිරිවැය :-

| මූලාශ්‍රයන් | යෙදවුම් | අරමුදල් ( රු.) | වෙනත් |
|---|---|---|---|
| ප්‍රතිලාභියාදායකත්වය | | | |
| දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | | | |
| බැංකු ණය | | | |
| **එකතුව** | | | |

13. ව්‍යාපෘතියෙන් ලබා දිය හැකි සෘජු රැකියා ප්‍රමාණය :-

වක්‍ර රැකියා ප්‍රමාණය :-

14. දිවි නැගුම සංවර්ධන නිලධාරී

ඉහත ව්‍යාපෘතිය සදහා රු................................ ක මුදලක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර මෙම තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය......................                                  ප්‍රතිලාභියාගේ අත්සන..............................

15. දිවිනැගුම ප්‍රාදේශීය නිලධාරි ,

ප්‍රතිලාභියා විසින් යෝජිත ඉහත ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් කරන ලද තොරතුරු පරික්ෂා කල අතර මෙම ව්‍යාපෘතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි. එසේම මෙම ප්‍රතිලාභියා ................................................................ …... ඡේද අංක **13**යටතේ දක්වා ඇති අදාළ නිර්ණායකය දක්වන්න ............................................................ බවද සහතික කරමි.

දිනය......................

..........................................................................................

**දිවි නැගුම සංවර්ධන නිලධාරීගේ නම හා අත්සන**

16. ප්‍රාදේශීය ලේකම්/ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටු ලේකම්,

ඉහත තොරතුරු පරික්ෂා කල අතර අදාළ නිර්ණායකයට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ..................................

...................................................................................................................................................

.......... **ප්‍රතිපාදන ලබා දිය හැකි ක්‍රමවේදය සඳහන් කරන්න** ලබා දීම සුදුසු වේ. ඒ අනුව ව්‍යාපෘති ඇස්තමේන්තුගත මුදලින් රු. ......................................................................... මුදලක් ලබා දිම නිර්දේශ කරමි.

දිනය......................

...................................................................................

**දිවි නැගුම ප්‍රාදේශීය නිලධාරි නම හා අත්සන**

# දිවිනැගුම ජීවනෝපාය ව්‍යාපෘති තොරතුරු ලේඛනය - 2014

**ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය :-.....................................**

| අනු අංක | ග්‍රාම නිලධාරී වසම | ප්‍රතිලාභියාගේ නම | ව්‍යාපෘතියේ නම | අරමුදල් සම්පාදනය | | | අරමුදලේ ස්වභාවය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඇස්තමේන්තු මුදල (රු) | දිවිනැගුම මුදල් (රු.) | ප්‍රතිලාභි දායකත්වය (රු.) | **100%** ප්‍රදානයකි | **50%** ප්‍රදානයකි | නැවත අය කිරීමකි |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | **එකතුව** | | | | | | | | |

අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ නිර්දේශ මත අනුමත කරමි.

……………….........………………… ……………………………..

දිනය :-....................... දිවිනැගුම ප්‍රාදේශීය නිල දිනය :-........................ ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන

## දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

*දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පිළිබඳව වැඩිදුර විමසීම්*

| සේවා ස්ථානය | | ආයතන ප්‍රධානියාගේ නම | ලිපිනය | දුරකථන අංකය | | ෆැක්ස් අංකය |
|---|---|---|---|---|---|---|
| | | | | කාර්යාලය | පෞද්ගලික | |
| කලාප අංක 01 | කොළඹ<br>කළුතර<br>ගාල්ල<br>මාතර<br>රත්නපුර | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>ආර්.පී.බී. තිලකසිරි මහතා | 4 වන මහල,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල | 011 2872201 | 077 3528017 | 011 2889002 |
| කලාප අංක 02 | ගම්පහ<br>කුරුණෑගල<br>පුත්තලම<br>කෑගල්ල | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>එච්.එම්. ජයතිලක හේරත් මහතා | වේරගල,<br>පුත්තලම<br>පාර,<br>වාරියපොල | 037 2057747 | 077 1708997 | 037 2057748 |
| කලාප අංක 03 | මහනුවර<br>නුවරඑළිය<br>මාතලේ<br>බදුල්ල | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>අමරානන්ද වීරසිංහ මහතා | 1120,<br>ගැටඹේ,<br>පේරාදෙණිය | 081 2386041 | 077 3105306 | 081 2386042<br>081 2386043 |
| කලාප අංක 04 | හම්බන්තොට<br>මොණරාගල<br>අම්පාර | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ,<br>ඒ.පී.එස්. රංජිත් ගුණසේකර<br>මහතා | අළුත් පටුමඟ,<br>බුල්ජන්ස්<br>පාර,(පැරණි | 047 2222227<br>047 2222228 | 071 4492083 | 047 2222227 |
| කලාප අංක 05 | අනුරාධපුරය<br>පොලොන්නරුව<br>ත්‍රිකුණාමලය<br>මඩකලපුව | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>එස්.කේ. ලියනගේ මහතා | 20/1/1,<br>මෙත්තා<br>මාවත,<br>ගුවන්තොටුප | 026 2224005 | 077 7517353 | 026 2224005 |
| කලාප අංක 06 | යාපනය<br>කිළිනොච්චිය<br>මුලතිව්<br>වව්නියා<br>මන්නාරම | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි මහතා | මාන්නාරම පාර | 024 2227211 | 024 2227706 | 077 3171949 |

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

## දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014

*දිස්ත්‍රික් මට්ටමින් මාසික ප්‍රගති වාර්තාව*

....................................... මාසය

කලාපය - .......................................................

දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශය - .................................................................

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ගණන - ..............................................

### *භෞතික ප්‍රගතිය*

| ව්‍යාපෘති වර්ගය | සංඛ්‍යාව | අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | ප්‍රතිලාභි දායකත්වය (රු.) | වියදම් කල මුදල (රු.) | තවදුරටත් අවශ්‍ය මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|---|---|---|
| **කෘෂි සංවර්ධන** | | | | | |
| **පශු සම්පත්** | | | | | |
| **ධීවර** | | | | | |
| **කර්මාන්ත සංවර්ධන** | | | | | |
| **එකතුව** | | | | | |

- ***මෙහි සවිස්තර වාර්තා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුවේ.***

### *මූල්‍ය ප්‍රගතිය*

| අනු අංකය | වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අනුමත මුදල් ප්‍රමාණය (රු.) | ලබාදුන් මුදල් ප්‍රමාණය (රු.) | වියදම් කල මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|---|---|---|
| 01 | ව්‍යාපෘති මුදලම එනම් 100 % ක ප්‍රදානයක් ලබා දිම. | | | | |
| 02 | ව්‍යාපෘති මුදලම එනම් 100 % ක ප්‍රතිපාදන ලබා දි නැවත 50 % ක් චක්‍රිය අරමුදලට අයකර ගැනිම. | | | | |
| 03 | ව්‍යාපෘති මුදලින් 50 % ක ප්‍රතිපාදන ලබා දීම. (සමාන වාරික ගණනකින් නැවත අයකල හැකි පරිදි) | | | | |
| 04 | දිවිනැගුම ප්‍රජා මුල බැංකු ණය පහසුකම් ලබා දිම. | | | | |
| 05 | ජීවනෝපාය චක්‍රිය අරමුදලින් ණය පහසුකම් ලබා දිම. | | | | |
| | **එකතුව** | | | | |

**දිනය ....................................** **.......................................................**

**කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**